**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය - 2021**

**----------------------------------------------------------------------**

**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 සැප්තැම්බර් 29 දින එළඹි අංක 5788 -එල්කේ දරණ ණය ගිවිසුමේ පොදු කොන්දේසිවල ඇතුළත් II බී (3) වගන්තිය සහ 4.09 (බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි සැලකෙන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**--------------------------------------------------------------------------------**

**ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වත්කම් කළමනාකරණය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ සැලසුම්කරණය- ඉදිකිරීම- නඩත්තුව හා ක්‍රියාත්මක කිරීම යන කරුණු නිසි ක්‍රම වේදයකින් යුතුව භාවිතාකර නිමැවුම් සහ කාර්ය සාධනය පදනම්කරගත් කොන්ත්‍රාත් ක්‍රම භාවිතයෙන් සකසන ලද ආකෘතියක් (OPBRC) යටතේ පැලියගොඩ - පුත්තලම මාර්ගයේ ජා-ඇල සිට හලාවත දක්වා කි.මී. 58 කින් යුත් (කොටසක්) නියමුකරණය කිරීමයි. සංවර්ධන ණය ගිවිසුම් අංක 5788 අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වි.ගැ.හි මිලියන 90.5 කට සමාන එ.ජ.ඩො මිලියන 125ක් හෙවත් රු.මිලියන 18,125 ක් වන අතර සම්පූර්ණ වටිනාකම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවී තිබුණි. කෙසේවෙතත්, 2018 අගෝස්තු 15 දිනැති අංක 18/1682/805/051 දරණ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ව්‍යාපෘතියේ මූලික විෂය පථය වෙනස්කර තිබුණි. ඒ අනුව, මූලික ණය ප්‍රතිපාදනයෙන් රු. මිලියන 14,500 කට සමාන එ.ජ.ඩො මිලියන 100ක් ව්‍යාපෘතියෙන් ඉවත්කර, සියළුම පළාත් මාර්ග වැඩිදියුණු කිරිම සඳහා පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයට වෙන්කර දී තිබුණි. ඉතිරි ශේෂයෙන්, ව්‍යාපෘතියේ කටයුතු සිදුකිරීම සඳහා රු. මිලියන 2,320 කට සමාන එ.ජ.ඩො මිලියන 16 ක් වෙන්කර තිබූ අතර ඉතිරි මුදල වූ රු.මිලියන 1,232.5කට සමාන එ.ජ.ඩො මිලියන 8.5ක් මාර්ග නඩත්තු භාර අරමුදලට මාරුකර තිබුණි. කෙසේවෙතත්, 2020 මැයි 06 දින ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීමකට අනුව කොවිඩ් 19 වැඩපිළිවෙල සඳහා එ.ජ.ඩො මිලියන 7ක් මාරුකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද මුළු ණය ප්‍රමාණය රු. මිලියන 1,305කට සමාන එ.ජ.ඩො මිලියන 9 ක් දක්වා නැවතත් අඩු කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජූනි 30 දින ආරම්භ කර 2018 අගෝස්තු 15 දින ප්‍රතිව්‍යුහගත කර තිබුණු අතර 2023 මාර්තු 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.**

**1.3 මතය**

**------**

**ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**-------------------**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.**

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබදව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 1958 සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වගන්තිය | සාමාන්‍යයෙන් සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය සියයට 8ක් සහ සේවායාගේ දායකත්වය සියයට 12ක් වුවද ව්‍යාපෘතිය 1958 සේවක අර්ථසාධක අරමුදල් පනතට එරෙහිව සේවකයා ගෙන් සියයට 10ක් හා සේවායාගෙන් සියයට 12ක් ලෙස යොදාගෙන තිබුණි. | සේවක අර්ථසාධක අරමුදල් පනතේ සඳහන් පරිදි සේ.අ.සා.අ දායකය ඉදිරි මාසයේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. | 1958 සේවක අර්ථසාධක අරමුදල් පනත සමග අනුකූල වීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය**

| | සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | විගණන ගැටලු | ප්‍රමාදයන් සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක/ප්‍රතිශතය | අත්කරගත් කාර්යසාධනය ඒකක/ප්‍රතිශතය | | |
| 1. | වත්කම් කළමණාකරනය සහාය සහ ඒකකවලට අදාල ධාරිතා වර්ධනය ක්‍රියාත්මක කිරීම | 48.47 | 39.4 | ක්‍රියාකාරකමේ භෞතික ප්‍රගතිය ඉලක්කයෙන් සියයට 9.07කින් පිටුපසින් වේ. | ප්‍රමාදයන් සඳහා කොවිඩ් 19 වසංගත තත්ත්වය බලපාන ලදී. |
| 2. | මාර්ග ආරක්ෂාව පිළිබඳව ධාරිතා වර්ධනය, පුහුණුව සහ උපදේශනය | 18.00 | 9.35 | ක්‍රියාකාරකමේ භෞතික ප්‍රගතිය ඉලක්කයෙන් සියයට 8.65කින් පිටුපසින් වේ. | ප්‍රමාදයන් සඳහා කොවිඩ් 19 වසංගත තත්ත්වය බලපාන ලදී. |

| | | | |
|---|---|---|---|
| 3. උපකරණ | 5.92 | 5.03 | ක්‍රියාකාරකමේ භෞතික ප්‍රගතිය ප්‍රමාදයන් සඳහා කොවිඩ් 19 වසංගත ඉලක්කයෙන් සියයට 0.89කින් තත්ත්වය බලපාන ලදි. පිටුපසින් වේ. |

කළමනාකරණයේ ප්‍රතිචාර — 2021 දෙසැම්බර් 31 දිනට ඉලක්කය සියයට 72.39 වේ. අත්කර ගත් භෞතික ප්‍රගතිය සියයට 53.78ක් වේ. ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය අපේක්ෂිත ඉලක්කයට වඩා සියයට 18.61කින් පිටුපසින් වේ.

විගණකගේ නිර්දේශය — යෙදවුම්වල පොදු මිල මට්ටමේ ඉහළයාම හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය ඉහළ යෑම වැළැක්වීම සඳහා ව්‍යාපෘතියේ කාර්යසාධනය ඉහළ නැංවීමට පියවර ගත යුතු අතර කඩිනමින් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත යුතුය.

### 3.2 නිෂ්කාර්ය/ ඌන උපයෝජිත සම්පත්

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | රු.මිලියන 1,305කට සමාන එජඩො මිලියන 9ක ලෝක බැංකු ණය පහසුකමින් වර්ෂ 4 මාස 03 ගතවීමෙන් පසුව ව්‍යාපෘතිය විසින් සියයට 16ක් නියෝජනයවන රු.මිලියන 266කට සමාන එ.ජ.ඩො.මිලියන 1.41ක් පමණක් උපයෝජනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එ.ජ.ඩො මිලියන 7.59ක වැඩි මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට භාවිතයට නොගෙන පැවතුණි. | ව්‍යාපෘතියේ විෂය පථය වෙනස්වීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට භාවිත කළ සත්‍ය මුදල එ.ජ.ඩො මිලියන 1.414කට සමාන රු. මිලියන 266.19ක් පමණක් විය. 2020 සහ 2021 අපහසු වර්ෂ දෙකකින් පසුව එදිනට ණය මුදල වියදම් නොවී පවතී. | ඉතිරි කටයුතු හඳුනාගෙන 2023 මාර්තු 31 දින ණය ගිවිසුම අවසන් වීමට පෙර ඒවා නිම කිරීමට කටයුතු කඩිනම් කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | 2020 වර්ෂය දක්වා දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සහ ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය අතර කාර්යාල කුලී පිරිවැය රු. 5,878,000 සමානව බෙදා තිබුණි. දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2021 ජුනි 30 දින සිට ගොඩනැගිල්ලෙන් ඉවත්ව තිබුණද කුලී පිරිවැය අඩු කිරීමට පියවර ගැනීමකින් තොරව TCAM ව්‍යාපෘතිය විසින් මුළු කුලිය දරා තිබුණි. | විගණන වාර්තාවේ සඳහන් කර ඇති විස්තර සමග එකඟ වේ. | ගොඩනැගිල්ලේ හිමිකරු වෙත අමතර ඉඩ ප්‍රමාණය භාරදීමට පියවර ගත යුතු අතර ඒ අනුව කුලිය අඩු කළ යුතුය. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| **2021 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුමට අනුව, 2021 වර්ෂය සඳහා එකතුව රු. මිලියන 1,371 වටිනා ප්‍රසම්පාදන කටයුතු 10ක් සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 430ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 5ක් පමණක් ආරම්භ කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්මේ එකතුව රු. මිලියන 941 වටිනා කටයුතු 5ක් ව්‍යාපෘතිය විසින් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.** | **2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට අනුව, . රු. මිලියන 1,371ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු 10ක් සැලසුම් කර තිබුණි. ප්‍රදානය කරන ලද/ නිමකරන ලද කොන්ත්‍රාත්වල මුළු වටිනාකම රු.මිලියන 430කි.** | **ප්‍රමාදවූ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර ඉලක්ගත දිනයන්ට වැඩ විෂය පථය නිම කිරීමට පියවර ගත යුතුය.** |

## 3.4 මානව සම්පත් කළමනාකරණයට අදාළ ගැටලු

| තනතුරු | තනතුරු ගණන | | | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | අනුමත | 2021 දෙසැම්බර් 31 දිනට සත්‍ය | පුරප්පාඩු/ අතිරික්ත සංඛ්‍යාව | **විගණන වාර්තාවේ සඳහන් කර ඇති විස්තර සමග එකඟ වේ. කොවිඩ් වසංගතය සහ තෝරාගත් අයදුම්කරු විසින් පත්වීම් භාර නොගැනීම වැනි නොවැළැක්විය හැකි හේතු නිසා 2021 අවසානය වන විටත් පුරප්පාඩු 06ක් සම්පූර්ණ කර නොතිබුණි.** | **අවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට සහ සැලසුම් කළ දිනයන්ට ව්‍යාපෘතියේ වැඩ විෂය පථය නිම කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ.** |
| **ප්‍රසම්පාදන විශේෂඥයන්** | **01** | **-** | **01** | | |
| **ඉංජිනේරු ps4** | **02** | **-** | **02** | | |
| **GIT විශ්ලේෂක** | **01** | **-** | **01** | | |
| **රූප විශ්ලේශක (Image Anaylist)** | **09** | **08** | **01** | | |